**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතිය - 2021**

-----------------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3029 සහ 3030-එස්ආර්අයි(එස් එෆ්) දරන ණය ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ව්‍යාපෘති හා ණය ගිවිසුම් වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එ.ජ.ඩො.මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 හෝ සියයට 59.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 හෝ සියයට 15.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 18 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යායනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 හෝ සියයට 25.4 කට සමාන එ.ජ.ඩො. මිලියන 30 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. තවද, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එ.ජ.ඩො. මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එ.ජ.ඩො. මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2022 ඔක්තෝම්බර් 24 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

වැඩසටහනේ - ව්‍යාපෘතිය 02, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතිාය් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.1 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

| නීති,රීති හා රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- | --- |
| 2019 මාර්තු 15 දිනැති 2019/01 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 2.3.2 වගන්තිය අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඵලදායීතාවය සහතික වීම පිණිස සැමවිටම ව්‍යාපෘති අධ්‍යක්ෂකකවරයා පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. | වැඩසටහනේ ව්‍යාපෘති 1,2 සහ 3 ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මඟින් ක්‍රියාත්මක කරමින් පැවතියද, 2021 පෙබරවාරි 02 වන දින සිට ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික හා වත්කම් කළමණාකරණ අංශයේ රාජකාරි ආවරණය කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා අතිරේක සාමාන්‍යාධිකාරී ලෙස උසස් කර ඇත. | හිටපු නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා (GCWWMIP) වන ඉංජිනේරු ධම්මික පෙරේරා මහතාව ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා ලෙස පූර්ණ කාලීනව පත්කර ඇත. | ව්‍යාපෘති කළමනාකරණ ඵලදායීතාවය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා සැම විටම පූර්ණකාලීන පදනමින් බඳවාගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ක්‍රියාකාරකම් 13 කින් සමන්විත වූ අතර, 2021 දෙසැම්බර් 31 දිනට ඒ අතරින් නිම කර තිබුණේ ක්‍රියාකාරකම් 07 ක් පමණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 72.63 ක් සහ සියයට 59.26 ක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය අත්කරගෙන තිබුණේ සියයට 11.08 ක භෞතික ප්‍රගතියක් පමණක් බවට නිරීක්ෂණය විය. ක්‍රියාත්මකව පවතින ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ.

| අනු අංකය | ක්‍රියාකාරකම | ඒකකය | අපේක්ෂිත ඉලක්ක | 2021 දෙසැම්බර් 31 දිනට ඉලක්ක ළඟාකර ගැනීම | විගණන නිරීක්ෂණ | කළමණාකරනයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| ------ | ---------------- | --------- | ------------- | --------------- | ----------------------- | ---------------------- | ---------------------------- |
| (අ) | කොළඹ නගරයේ බටහිර කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා පද්ධති පුනරුත්තාපනය (ICB-03) | | | | ව්‍යාපෘතිය නිම කිරීමට අහිතකර ලෙස බලපාන අතර සැලසුම් කල පරිදි කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 18 ට අඩුකිරීමේ අපේක්ෂිත ඉලක්කය ළඟා වීමට නොහැකි වේ. | නොවැලැක්විය හැකි තත්ත්වයන් මත සාධාරණ හේතු සලකා බලා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදු විය. කෙසේවෙතත්, ආදායම් නොලබන ජලයෙහි අපේක්ෂිත ඉලක්කය මේ දක්වා ළඟා වී ඇත. කෙසේ වෙතත්, ප්‍රමාදය හඳුනාගෙන කොන්ත්‍රාත් කාලය තුල වැඩ නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. | ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කල යුතුය. |
| | - නළ එලීම (ප්‍රධාන ෆීඩර් නල ඇතුළුව) | මීටර් | 114,184 | 107,972 | | | |
| | - සේවා සම්බන්ධතා මාරු කිරීම් | නිවාස ඒකක | 7,986 | 5,491 | | | |
| | - දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ ප්‍රගතිය (සම්පූර්ණයෙන් සම්පූර්ණ කර ප්‍රාදේශිය සහය සේවා මධ්‍යස්ථාන වෙත භාර දෙන ලදී.) | සංඛ්‍යාව | 18 | 04 | | | |
| | - සමස්ත කොන්ත්‍රාත් ප්‍රගතිය | | | | | | |
| | • ඇස්තමේන්තුගත නල එලීම් සහ සේවා සම්බන්ධතා මාරු කිරීම් සංශෝධනය වී ඇත. | ප්‍රතිශතය | 95.1 | 84.7 | | | |
| (ආ) | කොළඹ නගරයේ දකුණ කොටසෙහි ආදාම් නොලබන ජලය අඩුකිරීම සඳහා පද්ධති පුනරුත්තාපනය (ICB-04) | මීටර් | 217,716.92 | 149,075 | ව්‍යාපෘතිය නිමකිරීමට අහිතකර ලෙස බලපාන අතර සැලසුම් කළ පරිදි කොළඹ | නොවැලැක්විය හැකි තත්ත්වයන් මත සලකා බලා කොන්ත්‍රාත් කාලය | ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ |
| | - නළ එලීම් (ප්‍රධාන ෆීඩර් නල | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඇතුළුව) | | | | නගරයේ ආදායම් නොලබන ජලය සියයට 18 ට අඩුකිරීමේ අපේක්ෂිත ඉලක්කය ළඟාවීමට නොහැකි වේ. | දීර්ඝ කිරීමට සිදු විය. කෙසේවෙතත්, ආදායම් නොලබන ජලයෙහි අපේක්ෂිත ඉලක්කය මේ දක්වා ළඟා වී ඇත. කෙසේ වෙතත්, ප්‍රමාදය හඳුනාගෙන කොන්ත්‍රාත් කාලය තුල වැඩ නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. | වැඩ සමීපව නිරීක්ෂණය කල යුතුය. |
| | - සේවා සම්බන්ධතාමාරු කිරීම් | නිවාස ඒකක | 32,461 | 5,640 | | | |
| | - දිස්ත්‍රික් මැනුම් ප්‍රදේශ ප්‍රගතිය (සම්පූර්ණයෙන් සම්පූර්ණ කර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන වෙත භාර දෙන ලදී.) | සංඛ්‍යාව | 23 | 01 | | | |
| | - සමස්ත කොන්ත්‍රාත් ප්‍රගතිය | ප්‍රතිශතය | 80.4 | 61.39 | | | |
| (ඇ) | පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සඳහා කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම | ඉදිකිරීම් කාලය තුල ඉඩමක් නොතිබීම හේතුවෙන් ඉදිකිරීම් ආරම්භ නොකළ අතර නව ඉදිකිරීම සඳහා විදේශීය සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී නොතිබුණි. | | | මේ අනුව, පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සැක සහිතය . | යෝජිත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවා ඇත. කෙසේවෙතත්, මෙම නිර්මාණය අපට අනුමැතිය ලැබුනු පසු ඕනෑම අවස්තාවක භාවිතා කල හැකිය. | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී සහ ඉදිකිරීම් කොන්ත්‍රාතතුව ප්‍රදානය කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කල යුතුය. |
| (ඇ) | යෝජිත පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාර ගොඩනැල්ල සහ ආපන ශාලාව ඉදි කිරීම. | ප්‍රතිශතය | 100 | 87.3 | මෙම ඉදිකිරීමේ ප්‍රමාදය ව්‍යාපෘතිය නිම කිරීමට අහිතකර ලෙස බලපෑ හැකිය. | දැනුවත් පරිදි, පැවති කොවිඩ් 19 තුන් වන රැල්ල පාලනයකින් තොරව ව්‍යාපෘති ප්‍රගතියට දැඩි බලපෑමක් ඇති කිරීමට හේතුවූ අතර | ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්තුකරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ව්‍යාපෘතිය නිමකිරීමට සැලසුම් කල කාල දීර්ඝ කිරීම් යටතේ ලබා දී තිබූ දිනයට වඩා වැඩි කාලයක් ගැනීමටද එය හේතු විය. | |
| (ඉ) | MDTD සඳහා පුහුණු උපකරණ හා ගෘහ භාණ්ඩ | ලේඛන සකස් කිරීම සිදුවෙමින් පවතී. | ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීමට අහිතකර ලෙස බලපායි. | අවශ්‍ය පරිදි උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා වරින් වර ටෙන්ඩර් කැඳවනු ලැබේ. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් වන දිනට පෙර නිම කිරීමට ක්‍රියා කල යුතුය. |
| (ඊ) | MDTD පුහුණු පද්ධතිය නවීකරණය කිරීම සඳහා උපදේශන සේවා | ලේඛන සකස් කිරීම සිදුවෙමින් පවතී. | ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීමට අහිතකර ලෙස බලපායි. | අභ්‍යන්තරව පවතින සම්පත් පුහුණු මධ්‍යස්ථාන මොඩියුලය සකස් කිරීමට භාවිතා කරන අතර බාහිර උපදේශන සේවා සඳහා ඇරයුම් නොකරන ලදී. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් වන දිනට පෙර නිම කිරීමට ක්‍රියා කල යුතුය. |

## 3.2 මතභේදයට තුඩු දුන් හේතු

| විගණකගේ නිරීක්ෂණ | | කළමණාකරණය අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට වසර 07 ක් ගත වී ඇතත්, ඉදිකිරීම් සඳහා සුදුසු ඉඩමක් නොතිබීම හේතුවෙන් පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇත. ඉඩම් අත්පත් කර නොගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබියදීත්, වාස්තු විද්‍යාත්මක, සංකල්පීය සැලසුම් සහ ඉදිකිරීම් යනාදී වශයෙන් අවස්ථා 03 කදී උපදේශන සේවා කොන්ත්‍රාත් 03 ක් ප්‍රදානය කර තිබුණි. පසුව, උපදේශන ගාස්තු වශයෙන් එකතුව වූ රු.මිලියන 28.19 ක් දරමින් ඉඩමෙහි ප්‍රමාණය සහ ගොඩනැගිල්ලෙහි විෂය පථය ඇතුළුව ඉඩම් පවරාගැනීමේ ක්රියාවලිය ප්‍රමාදවීම වෙනස්වීම යනාදිය හේතුවෙන් ඒවා අවලංගු කර ඇත. කෙසේවෙතත්, ඉදිකිරීම් සඳහා ඉඩමක් නොමැතිකම සහ 2022 ඔක්තෝම්බර් 24 දින ව්‍යාපෘතියේ ණය ගිවිසුම අවසන් වන බැවින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව නව ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා දී නොතිබීම හේතුවෙන් පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම් සැක සහිත විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2021 දෙසැම්බර් 31 දිනට උපදේශන ගාස්තු ලෙස දරන ලද රු.මි. 28.19 ක් සහ ඉඩම් පවරාගැනීමේ ගාස්තු ලෙස දරන ලද වියදම් රු.මිලියන 1.45 ක් ව්‍යාපෘතියට අලාභ වී ඇත. | යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවා ඇත. කෙසේවෙතත්, මෙම නිර්මාණ සැලසුම් අනුමැතිය ලැබුණු පසු ඕනෑම අවස්ථාවක අපට භාවිතා කළ හැකිය. | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට පෙර ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය අවසන් කළ යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| අනු අංකය | විගණකගේ නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 23 න් ආදායම් නොලබන ජලය අඩුකිරීමේ අපේක්ෂිත ඉලක්කය සපුරාගැනීමෙන් අනතුරුව මණ්ඩලය වෙත භාර දී තිබුණේ එක් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශයක් පමණි. කෙසේ වෙතත්, උපකොන්ත්‍රාත්කරුවන් විසින් වැඩ අත්හැර දැමීම හේතුවෙන් 2021 දෙසැම්බර් සිට දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 04 ක් වැඩ නතර කර තිබූ අතර උපකොන්ත්‍රාත්කරුවකු විසින් වැඩ අතහැර දැමීම හේතුවෙන් දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශවලින් එකක් නවතා තිබූ අතර මීටර 63,734 ක් වෙනුවට නල එළීම් සඳහා මාර්ග අනුමැතිය ඉල්ලීම් කර තිබුණේ මීටර 4,908 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව, ව්‍යාපෘතිය කොන්ත්‍රාත් කාලය 2022 ජුනි මස අවසන්වීමට සහ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අවසන් දින වන 2022 ඔක්තෝම්බර් 24 වැනි දිනට පෙර කොන්ත්‍රාත්තුව යටතේ ඇති ඉතිරි වැඩද නල එළීම් මීටර 68,641.92 ක්ද, නිවාස සම්බන්ධතා මාරු කිරීම් 26,821 ක්ද, වැල්ව් චෙම්බර්ස් ස්ථාපිත කිරීම් 431 ක්ද, මාර්ග හුවමාරු වීම් වැඩ 340 ක් හා පවතින නල අක්‍රිය කිරීම් යනාදිය වැඩ නිම කිරීමට හැකිවේද යන්න විගණනයට සැක සහිත විය. | අපජල ව්‍යාපෘතිය අවසන් වන තුරු දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 32 බී සහ 33 ඒ හි මාර්ග කිහිපයක් ආරම්භ කල නොහැකිය. | සංශෝධිත කොන්ත්‍රාත් කාලයට පෙර ඉතිරි වැඩ නිම කිරීමට උපදෙස් ලබා දිය යුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කල යුතුය. |
| (ආ) | භාරදෙන අවස්ථාවේදී, දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශ 15A සහ 16A හි ආදායම් නොලබන ජල ප්‍රතිශතය පිළිවෙලින් සියයට 16 ක් සහ සියයට 8 ක් ලෙස නිරීක්ෂණය වුවද, පසුව ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව පිළිවෙලින් 15A හි ආදායම් නොලබන ප්‍රතිශතය සියයට 20 දක්වා වැඩිවීමක් හා 16A හි ආදායම් නොලබන ප්‍රතිශතය අසාමාන්‍ය අගයක් ලෙස සියයට සෘණ 4 දක්වා අඩු වීමේ වෙනසක් නිරීක්ෂණය විය. කෙසේවෙතත්, එවැනි විචලනයන් සඳහා හේතු සොයා බලා ඒවා වහාම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. තවද, ව්‍යාපෘතියේ ණය අවසන් වන දිනට පෙර ඉතිරි නළ එළීම් කටයුතු අවසන් කිරීම සහ දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශ භාරදීම් නිම කිරීම විගණනයට සැක සහිතය. | ආදායම් නොලබන ජල කණ්ඩායම් දිනපතා දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශවල ආදායම් නොලබන ජල සංඛ්‍යාව අඛණ්ඩව අධීක්ෂණය කරමින් සිටින අතර එය අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | සංශෝධිත කොන්ත්‍රාත් කාලයට පෙර ඉතිරි වැඩ නිම කිරීමට උපදෙස් ලබා දිය යුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කළ යුතු අතර භාර දුන් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශවල ආදායම් නොලබන ජල සංඛ්‍යාව අඛණ්ඩව අධීක්ෂණය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සහාධිපත්‍ය යෝජනා ක්‍රම 11 න් 03කට අදාල වැඩ අවසන් කර අදාල බලධාරීන් වෙතත භාරදී තිබූ අතර සහාධිපත්‍ය යෝජනා ක්‍රම දෙකක් අවසන් අදියරේ පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 මාර්තු 31 ක්ෂේත්‍ර පරීක්ෂණ දිනය වන විට සම්බන්ධතා 1,144 න් සම්බන්ධතා සියයට 12.34 කට සමාන සම්බන්ධතා 140 ක් පමණක් සම්පූර්ණ කර ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කාලයෙහි ඉතිරි මාස 2 ඇතුලත සහාධිපත්‍ය යෝජනා ක්‍රම 06 ක ඉතිරි පුනරුත්ථාපන කටයුතු සහ සම්බන්ධතා 1004 මාරුකිරීම් අවසන් කිරීමට හැකිවේද යන්න විගණනයට සැක සහිතය. | පුනරුත්ථාපන කටයුතුවල දුෂ්කරතා හේතුවෙන් සහාධිපත්‍ය ජල සැපයුම් පද්ධතිය ප්‍රතිසංස්කරණය කර ක්‍රියාත්මක කිරීම කොන්ත්‍රාත්කරු ප්‍රතික්ෂේප කරන ලදී. කොන්ත්‍රාත්කරු සමඟ පැවති සාකච්ජාව මත පහත තීරණ ගන්නා ලදී. මේ වන විට සහාධිපත්‍ය 05ක පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇති අතර නිවාස 488 ක් සඳහා මීටර මාරු කිරීම් සිදුකර ඇති අතර එය මුළු ගණනින් සියයට 43 ක් පමණ වේ. තවත් යෝජනා ක්‍රම 4ක් 2022 ජුලි මැද වන විට අවසන් කිරීමට බලාපොරොත්තුවේ. | ඉතිරි සහාධිපත්‍ය යෝජනාක්‍රම සම්පූර්ණ කිරීමට උපදෙස් ලබාදිය යුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කල යුතුය. |
| (ඈ) | 2018 ඔක්තෝම්බර් 16 වන දින රු.මිලියන 54.26 ක පිරිවැයකින් වෙබ් යෙදවුම් සහ පුහුණුව සඳහා GIS මෘදුකාංගය සංවර්ධනය කර සැපයීම සහ ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර 2019 වර්ෂය වන විට මාස 12 ක් ඇතුලත සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය විසින් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කාර්යාල 40 ක විස්තීරණ ආයතනික GIS පද්ධතිය ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුනි. කොන්ත්‍රාත්තුව යටතේ මූලික විෂය පථය සම්පූර්ණව තිබුණද, ප්‍රධාන කාර්යාලය විසින් මූලික විෂය පථය වෙනස් කර ඇති බැවින් කොන්ත්‍රාත්තුව යටතේ පද්ධති නවීකරණය තවමත් සම්පූර්ණ කර නොමැත. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට කිසිඳු පිරිවැයකින් තොරව මණ්ඩලයේ ක්ෂේත්‍ර සේවා යෙදවුම් සමඟ ඒකාබද්ධ වී මැනවින් ක්රියාත්මක වේ. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව, 2022 අගෝස්තු අවසන් වන විට සම්පූර්ණ කිරීමට නියමිතය.<br>මෘදුකාංග යෙදවුම් බලපත්‍ර සඳහා නඩත්තු කිරීම් අනිවාර්ය නොවේ. නමුත් පද්ධතියේ තිරසාරභාවය වැඩිදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ARCGIS server enterprise මෘදුකාංග යෙදවුමේ සඳහන් බලපත්‍රය දේශීයව නඩත්තු කිරීම සඳහා සලකා බැලිය හැක. | ඉතිරි වැඩ අවසන් කර නව ක්‍රමය ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර නඩත්තු වියදම් කොන්ත්‍රාත්කරු සමඟ සමාලෝචනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | තෙලවල පුහුණු මධ්‍යස්ථානය, ආපනශාලාව සහ නේවාසිකාගාර ගොඩනැගිල්ල සඳහා කොන්ත්‍රාත්තුව යටතේ සිවිල් ඉදිකිරීම් කටයුතු ඇතුලත් කර තිබුණද, එම කොන්ත්‍රාත්තුව යටතේ මෙම ගොඩනැගිල්ලට අවශ්‍ය කාර්යාල උපකරණ සහ උපාංග මිලදී ගැනීමට අදාල කිසිදු අංගයක් ඇතුලත් කර නොතිබුණි. එබැවින් කාර්යාල උපකරණ සහ උපාංග නොමැතිකම හේතුවෙන් ඉදිකිරීම් අවසන් වූ වහාම සම්පූර්ණ ගොඩනැගිල්ල භාවිතයට ගත හැකි වේද යන්න සැකසහිතය. | ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත් විෂය පථය තුල ගෘහභාණ්ඩ සැපයීම, සන්නිවේදන පහසුකම් යනාදී මූලික පහසුකම් වෙන් කෙරේ. රටතුල පවතින වත්මන් මිල උච්චාවචනය හේතුවෙන්, උපරිම පහසුකම් සහිතව ව්‍යාපෘතිය නිමකිරීමට කොන්ත්‍රාත්තුවේ අසම්භව්‍ය වෙන්කිරීම්වල සීමාව ඉක්මවා ඇත. සත්‍ය වශයෙන්ම, විෂය පථයෙහි කාර්යාල උපකරණ සඳහා අයිතම ආවරණය නොකරයි. | ඉදිකිරීම් අවසන් කිරීමට පෙර මෙම ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ සහ උපාංග සැපයීමට අවධානය යොමු කළ යුතුය. |
| (ඊ) | අයිඩ්වනි ප්‍රවාහ මීටර සහ දත්ත සටහන් කිරීම් සැපයීම, බෙදාහැරීම, ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2021 මැයි 31 දින ප්‍රදානය කරන ලද අතර 2022 මැයි 30 දිනට මාස 12 ක් ඇතුලත අවසන් කිරීමට සැලසුම් කර ඇත. අයිඩ්වනි ප්‍රවාහ මීටර සහ අදාල උපකරණ 2022 මාර්තු 01 වන දිනට මිලදී ගෙන සැපයුම්කරුගේ ගබඩාව වෙත ලැබී තිබූ අතර, කොන්ත්‍රාත්තුව යටතේ ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීමේ වැඩ 2022 මැයි 19 දින දක්වාත් අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුවේ ඉතිරිව ඇත්තේ මාලිගාකන්ද චේම්බර්ස් 03 ක් ඉදිකිරීමයි. ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය නිසා ප්‍රමාදයන් ඇති විය. | ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කළ යුතුය. |

### 3.4 වැඩබිම් පරීක්ෂාවන් සිදු කරන ලද නිරීක්ෂණ

| අනු අංකය | විගණකගේ නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | තෙලවල පුහුණු මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත්තුව 2022 අප්‍රේල් 07 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවට අනුව, පරීක්ෂන අවස්ථාව වන විට සැලකිය යුතු ඉතිරි වැඩ ප්‍රමාණයක් නිම කිරීමට ඇති බව නිරීක්ෂණය විය. ඊට අමතරව, 2022 අප්‍රේල් 07 ක්ෂේත්‍ර පරීක්ෂණ දිනය වන විටත් බටහිර ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුනි. එබැවින් මෙම කොන්ත්‍රාත්තුවේ | විවිධ හේතූන් නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ නියමිත පරිදි නිම කිරීමට බාධා එල්ල වී ඇත. | සංශෝධිත කොන්ත්‍රාත් කාලයට පෙර ඉතිරි වැඩ අවසන් කිරීමට උපදෙස් දිය යුතු අතර කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කළ යුතුය. |

ඉතිරි වැඩ 2022 අප්‍රේල් 30 වන විට අවසන් කළ හැකිද යන්න සැකසහිතය.

| | | | |
|---|---|---|---|
| (ආ) | කොළඹ නගරයේ දකුණු ප්‍රදේශයේ ආශ්‍රිත මාර්ග 07 ක නල එලීම් කටයුතු සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවට අනුව, පීඩන පරීක්ෂාවන් සහ නිවාස සම්බන්ධතා මාරු කිරීම් අවසන්වූ දින සිට මාස 08 ක් ගත වුවද ස්ථිර මාර්ග පුනස්ථාපනය සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සම්බන්ධතා මාරු කිරීමේ කෙළවර ආවරණය නොවන අතර පිටතට අනාරක්ෂිතව නිරාවරණය වේ. එබැවින් ඒවා ආරක්ෂාකර ගැනීම සඳහා විකල්ප ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගත යුතුය. | එවැනි නිවාස සම්බන්ධතාවල විවෘත කෙළවර වසා දැමීමට විකල්පයක් යොදා ගන්නා ලෙසට දැනටමත් කොන්ත්‍රාත්කරු දැනුම්දී ඇත. | එවැනි නිවාස සම්බන්ධතාවල විවෘත කෙලවර වසා දැමීමට වහාම පියවර ගත යුතුය. |

## 3.5 අතිරේක ක්‍රියාකාරකම්/ ව්‍යාපෘති අරමුණුවලට පරිබාහිරව සිදුකරන ලද වියදම්

| අනු අංකය | විගණකගේ නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් නවීන පන්නයේ ක්‍රෲ කැබ් රථ 30 ක් සහ ජල බවුසර් 10 ක් මිලදී ගෙන ඇත. තවද, ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය සනාථ කිරීමට ලේඛණගත සාක්ෂි නොතිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති විෂය පථයට පටහැනිව ක්‍රෲ කැබ් රථ 20 ක් සහ ජල බවුසර් 05 ක්, බස්නාහිර පළාතෙන් බාහිරව තවත් පළාත් 08 ක් සඳහා වෙන් කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය මඟින් දුෂ්කර කාලවලදී දුෂ්කර ප්‍රදේශවල ජනතාවට ජලය සැපයීම සඳහා පවතින ඉතුරුම් මුදලින් උපකරණ ලබාගෙන තිබුණි. මෙම අවශ්‍යතාව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් වේ. | ව්‍යාපෘති අරමුණුවලට අනුකූලව ව්‍යාපෘති අරමුදල් යෙදවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා කොළඹ මහනගර සභාවේ හි අදාල ඉඩම භාවිතා කර තිබූ බැවින් කොළඹ මහනගර සභා කාර්ය මණ්ඩලයේ වාහන නැවැත්වීම සඳහා ඉඩමක් කුලියට ලබා දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කුලී ගිවිසුමකට එළඹී ඇත. කෙසේ | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ කොළඹ මහනගර සභාව සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී. සාමාන්‍යාධිකාරී අනුමැතිය මත ගෙවීම් සිදුකරන ලදී. | ව්‍යාපෘති අරමුණුවලට අනුකූලව ව්‍යාපෘති අරමුදල් යෙදවීමට කටයුතු කල යුතුය. |

වෙතත්, වාහන නැවැත්වීමේ ඉඩම සඳහා 2020 ජනවාරි සිට 2021 ජනවාරි දක්වා කාලය සඳහා කුලී ගාස්තු ලෙස රු.මිලියන 1.63 ක මුදලක් ව්‍යාපෘතිය මඟින් ගෙවා ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ අවසන් අදියරේදී පවා මෙම ඉඩම පවරා ගැනීමේ කාරණය සම්බන්ධයෙන් දෙපාර්ශවයම විසඳුමකට පැමිණ නොතිබුණි.

## 3.6 අක්‍රිය / උපයෝජනය නොකල/ඌන උපයෝජිත වත්කම්

| අනු අංකය | විගණකගේ නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 18ට වඩා අඩු කිරීමෙන් ඵලදායී ආකාරයෙන් වඩා හොඳ ජල සැපයුම් සේවාවක් ලබාදීම සඳහා කොළඹ නගරයේ බටහිර හා දකුණ පුනරුත්ථාපන සහ ජල සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම යටතේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 41 ක මීටර 331,900.92 ක නල එලීම් සහ නිවාස ඒකකයන් සඳහා 40,447 ක් සඳහා සම්බන්ධතා මාරුකිරීම් සැපයීමට වැඩසටහනේ ව්‍යාපෘති 02 මඟින් දායක වී තිබේ. කෙසේවෙතත්,ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ වී මාස 87 ක් ගත වී ඇතත්, ආදායම් නොලබන ජලයෙහි අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමෙන් පසුව දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 41 න් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 05 ක් පමණක් සම්පූරණයෙන් අවසන්කර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාරදී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 දෙසැම්බර් 31 දක්වා කොළඹ නගරයේ දකුණ හා බටහිර ප්‍රදේශයන්හි සමස්ත ආදායම් නොලබන ජලය අඩු කිරීමට නොහැකි විය. එසේ වුවද, ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන්වීමට හා ආදායම් නොලබන ජලය අඩු වීමට පෙර 2018 වර්ෂයේ සිට ණය ආපසු ගෙවීම ආරම්භ කර ඇති අතර එය ඇ.එ.ජ.ඩොලර් මිලියන 8.61 ට | පැකේජ 03 සහ 04 හි බොහෝ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශවල භෞතික වැඩ දැනටමත් අවසන් කර ඇති අතර නව මාර්ග ක්‍රියාත්මක කර ඇත. කෙසේ වෙතත්, දැනට පවතින නල සම්බන්ධ විස්තර නොමැති ගැටළුව හේතුවෙන්, අත්හිටුවීමේ වැඩ තවමත් අවසන් කර නොමැත. කෙසේ වෙතත්, මෙම සියළු ඉතිරි වැඩ අවසන් කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පැවරීමට සෑම පියවරක් ගෙන ඇත. | 2022 ඔක්තෝම්බර් මාසයේ ණය අවසන් වන දිනට පෙර ඉතිරි වැඩ අවසන් කිරීමට සහ ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ. |

සමාන රුපියල් මිලියන 1,629.44 ක් ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘතියේ කාර්යයන්වල කාර්යසාධනය සහ ඌණ වියපැහැදම් කිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ණය ගිවිසුමෙන් වෙන්කරන ලද ප්‍රමාණයට වඩා බැඳීමේ ගාස්තු සහ පොලී ගාස්තු ලෙස රු.මිලියන 3.42 ක් සහ රු.මිලියන 45.43 ක් පිළිවෙලින් රජය විසින් දරා තිබුණි .

## 3.7 පෙර විගණන වාර්තාවලින් පෙන්වාදුන් විසඳී නොමැති කරුණු

| අනු අංකය | විගණකගේ නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- | --- |
| (අ) | 2017 පෙබරවාරි 22 දින ICB-04 කොන්ත්‍රාත්තුවට දේශිය සංරචකය යටතේ රු.මිලියන 577.67 ක් සහ විදේශීය සංරචකය යටතේ ඇ.එ.ජ.ඩො මිලිනය 4.15 ක් වැඩ පූර්ව අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය මූලික කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය වූ මාස 48 ඉක්මවී තිබියදීත් වැඩපූර්ව අත්තිකාරම්වලින් අයකර තිබුණේ සියයට 68 ක් පමණි. තවද, 2017 මාර්තු 01 දින අයි.සී.බී ICB - 03 කොන්ත්‍රාත්තුවේ වැඩපූර්ව අත්තිකාරම් ලෙස දේශීය සංරචකය යටතේ ලෙස රු.මිලියන 574.19 ක් සහ විදේශීය සංරචකය යටතේ ඇ.එ.ජ.ඩොලර් මිලියන 3.52 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් අයි.සී.බී 03 කොන්ත්‍රාත්තුවේ පළමු වැඩපූර්ව අත්තිකාරම අයකර ගැනීමට ඉදිකිරීම් ආරම්භ කොට වසර 02 ක් ගත වී තිබූ අතර පළමු කාලදිගුව සහ කොන්ත්‍රාත් මූලික කාල පරිච්ඡේදය සහ ලබාගත් පළමු කාල දිගුව ඉකුත්වී තිබියදීත් දේශීය මුදලින් රු.මිලියන 131.41 ට සමාන සියයට 28 ක් සහ ඇ.එ.ජ.ඩො. 1.94 සමාන සියයට 55 ක් ආපසු අයකර කර ගැනීමට පැවතුණි. ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාගේම අඩු ප්‍රගතිය හේතුවෙන් වැඩ පූර්ව අත්තිකාරම් | මෙම කාරණය කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කර ඇති අතර අත්තිකාරම් නැවත කඩිනමින් අයකර ගැනීමේ නව ක්‍රමයක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. | වැඩ කඩිනම් කිරීමට උපදෙස් ලබා දිය යුතු අතර අත්තිකාරම් අයකර ගැනීමේ නව ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

ආපසු අය කරගැනීම දිගු කාලයක් ප්‍රමාද වී තිබූ අතර, කොන්ත්‍රාත්කරුවන් ලබා ගත් පොළී රහිත ණයක් ලෙස මෙම අත්තිකාරම් දිගුකාලයක් රඳවාගෙන පවතී.

**3.8 පද්ධති හා පාලන**

| විගණකගේ නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|
| (අ) ලද තොරතුරුවලට අනුව ICB-03 කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ නල එලීමේ දුර මීටර 107, 333.01 ක් වූ අතර මින් ස්ථිර මාර්ග පුනස්ථාපනය මීටර 64,577.01 ක් 2021 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණි. කෙසේවෙතත්, ස්ථිර මාර්ග පුනස්ථාපන සිදුකරන ලද මාර්ග දුර ප්‍රමාණයෙන් මීටර 24,213.09 ක් පමණක් අදාල අධිකාරීන් වෙත භාරදී තිබුණි. එසේ වුවත් , 2022 පෙබරවාරි 28 දිනට ස්ථිර මාර්ග පුනස්ථාපනය සම්පූර්ණ කරන ලද මාර්ග දුර ප්‍රමාණය මීටර 69,558.84 ක් දක්වා 2022 පෙබරවාරි 28 දක්වා වැඩි වී තිබුනත්, 2021 දෙසැම්බර් 31 දින සිට 2022 පෙබරවාරි 28 දක්වා කිසිදු මාර්ග දුරක් අදාළ අධිකාරීන් වෙත භාර දී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අදාල අධිකාරින්ගෙන් සුරකුම් තැන්පතු නැවත අයකරගැනීමට ප්‍රමාද වීම සහ ව්‍යාපෘතියට දීර්ඝ කාලයක් සඳහා ස්ථිර මාර්ඟ පුනස්ථාපන කටයුතු පවත්වාගෙන යාමට සිදුවන බව නිරීක්ෂණය විය. | ස්ථිර මාර්ග පුනස්ථාපනය සිදුකරන ලද දිග මීටර 64,577.01 ක් තුළ කොළඹ නගර සභා හා වෙනත් පාර්ශවයන් විසින් පවරා නොගත් ටෙනමන්ට් උද්‍යාන මාර්ග (පටු මාර්ග) සැලකිය යුතු ප්‍රමාණයක් ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය, මෙහෙයුම් හා නඩත්තු වෙත දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ භාර දීමේදී මාර්ග පරීක්ෂා කර භාරගනු ඇත.<br>අපි ස්ථිර මාර්ග පුනස්ථාපන කටයුතු නිම කළද, පවතින මාර්ග අක්‍රීය කිරීමේ කටයුතු අවසන් වන තුරු කොළඹ මහනගර සභාව මාර්ග පවරා ගනු නොලැබේ. එබැවින් මාර්ග අධිකාරිය මඟින් මාර්ග පවරාගැනීමේ ප්‍රමාදයක් පවතී. | පවතින නල මාර්ග අක්‍රීය කිරීමේ කටයුතු නිම කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (ආ) ICB-03 කොන්ත්‍රාත්තුව යටතේ වෙන්කර තිබූ රු.මිලියන 225 වෙනුවට 2021 ඔක්තෝම්බර් 31 දිනට රු.මිලියන 274.18 ක මිල උච්චාවචනයන් ලෙස ගෙවා තිබුණි. එයින් රු.මිලියන 53.61 ක් 2021 මාර්තු සහ 2021 ඔක්තෝම්බර් මාස අතර කාලය දීර්ඝ කිරීම් සඳහා ගෙවා තිබුණි. කෙසේ වෙතත්, නියමිත කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුනේ නම්, ඉහත මිල උච්චාවචන වියදම් ව්‍යාපෘතියට | පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් අක්‍රීය වූ සම්පත් තක්සේරු කිරීමෙන් කොන්ත්‍රාත්කරුට ඔහුගේ සම්පත්වල අක්‍රීය පිරිවැය ලෙස රු.මිලියන 20 ක් ගෙවන ලද අතර අක්‍රීය කාලය සලකා බලා කාලය දීර්ඝ කිරීම් ලබා දෙන ලදී.<br>කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව, CIDA විසින් ප්‍රකාශයට පත්කරන ලද මිල දර්ශක මත පදනම්ව | නියමිත කොන්ත්‍රාත් කාල සීමාවන් තුළ කොන්ත්‍රාත් සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති කළමණාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වළක්වා ගත හැකිව තිබුණි. මීට අමතරව, මින් රු.මිලියන 49.18 ක මුදලක් විචලතා කමිටු අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | ද්‍රව්‍යවල මිල වැඩිවීම හේතුවෙන්, වැඩි වන ලද පිරිවැය පියවීම සඳහා කොන්ත්‍රාත්කරුට මිල වැඩිවීම ගෙවනු ලැබේ. | |
| (ඇ) | ICB- 04 කොන්ත්‍රාත්තුව යටතේ පිළිවෙලින් 2019, 2020 සහ 2021 වර්ෂවලදී නිමකර කොළඹ මහ නගර සභාවට භාර දී තිබූ මාර්ග 45 ක් සම්බන්ධයෙන් රු.මිලියන 16.04 ක් වටිනා සුරකුම්පත් තැන්පතු අයකර ගැනීමට ව්‍යාපෘතිය මඟින් කටයුතු කර නොතිබුණි. | සියලුම ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු ගොඩනගන ලද සැලසුම් (AS – Built drawings) මෘදු පිටපත් කොළඹ මහ නගර සභාව විසින් ඉල්ලීම් කර ඇත. අප විසින් ඒවා ඉදිරිපත් කර ඇති අතර ගොඩනගන ලද සැලසුම් ලැබීමෙන් අනතුරුව ආපසු ගෙවිය හැකි තැන්පතුව ප්‍රතිපූර්ණය කිරීමට කොළඹ මහ නගර සභාව එකඟ වී ඇත. | ආපසු ගෙවිය හැකි තැන්පතු ප්‍රතිපූර්ණය කිරීම සඳහා සියලුම තහවුරු කිරීමේ තොරතුරු ව්‍යාපෘති කළමණාකාරිත්වය විසින් ඉදිරිපත් කල යුතුය. |
| (ඈ) | 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමණාකරන චක්‍රලේඛයට අනුව, වැඩසටහනේ ව්‍යාපෘතිය - 02 හි ක්‍රියාකාරකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | මෙය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් පිළිතුරු දෙන ලදී. | අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීමට පියවරයන් ගත යුතුය. |